
# 7.1 ඒකකය - පැරණි ගංගා නිම්න ශිෂ්ටාචාරය

හැඳින්වීම :-


- මානවයා පරිණාමයට පත්වූ සත්වයෙකි.



- එම පරිණාමීයා ක්‍රියාවලියෙහි එක් වැදගත් අවස්ථාවක ලෙස මිනිසා ශිෂ්ඨාචර ගත වීම සැලකිය හැකිය.
- වනචාරි ජීවිතයෙන් මිදී මිනිසා ශීලචාර වීම නැතහොත් යහපත් ගති පවත්වාගෙන යාම ශිෂ්ඨාචාර ගතවීම ලෙස හඳුන්වයි.
- වාසස්ථාන ආදී අංශවල ඔවුහු යහපත් ගති පැවතුම් ප්‍රදර්ශනය කළහ.



- ගොවිතැන,වෙළඳාම,නගර පිහිටුවා ගැනීම ස්ථිර නිවාස තනා ගැනීම ශිෂ්ටාචාරයක ලක්ෂණ.
- ඈත අතීතයේදී ගංගා නිම්න ආශ්‍රතව බිහිවූ ප්රධාන ශිෂ්ටචාර හතරක් ඔබට පහත සිතියම නිරීක්ෂනය කිරීමෙන් හඳුනා ගන්නට පුළුවන්.




සිතියමෙහි දැක්වෙන ශිෂ්ටාචාර හතර පිහිට තිබූ වර්තමාන රටවල් හඳුනා ගනිමු.

| ශිෂ්ටාචාරයේ නම | ශිෂ්ටාචාරය පිහිටි වර්තමාන දේශය. |
|---|---|
| යුප්‍රටීස්-ටයිග්‍රිස් නිම්න | ඉරාකය |
| නයිල් නිම්න | ඊජිප්තුව(මිසරය) |
| ඉන්දු නිම්න | පකිස්ථානය |
| හොවැංහෝ නිම්න | චීනය |

# ශිෂ්ටාචාර ගංගා ආශ්‍රිතව බිහිවීමට හේතු.



1. ජලය :-

- මිනිසුන්ට ඔවුන් තුල ඇති කළ සතුන්ට හා ගොවිතැනට අවශ්‍ය ජල අවශ්‍යතාවය පහසුවෙන් සපුරා ගැනීමට.


2. සරු පස:-

- අවුරුද්දේ එක් කාලයක ලැබෙන වර්ෂාවෙන් ගංගා උතුරා යාම මේ නිස ගංගාවේ රොන්මඩ නදිය ගඟ දෙපස තැන්පත් වීමෙන් සාරවත් පසක් බිහි වීම.
- එම සාරවත් පසෙහි වැවෙන තෘණ වර්ග ඇති කරන ලද සතුන්ට ආහරයට ගැනීමට හැකිවීම.
- වගා කටයුතු කිරිමෙන් හොඳ අස්වැන්නක් ලබා ගත හැකිවීම.

3. ප්‍රවාහන හා ගමනා ගමන පහසුකම්:-


- ගංඟ පහසු ප්‍රවාහන මාර්ගයක් ලෙස යොදාගත හැකි වීම.
- විදේශ සමඟ වෙළඳාම් කිරීමේදී ගංගා හරහා යත්‍රා මඟින් භාණ්ඩ එහ මෙහා ගෙන යා හැකි වීමේ පහසුව.

# යුප්‍රටීස් - ටයිග්‍රිස් නිම්න ශිෂ්ටාචාරය




ඔබ දන්නවාද?

- යුප්‍රටීස්-ටයිග්‍රීරීස් නිම්න ශිෂ්ටාචරය ව්‍යාප්තව තිබුනේ වර්තමාන ඉරාකය ආශ්‍රිත ප්‍රදේශයේය.
- පර්සියානු බොක්කට ගලා බසින යුප්‍රටීස් හා ටයිග්‍රිස් ගංගා දෙක අතර මෙම ශිෂ්ටාචාරය ව්‍යාප්තව තිබූ බවට සාධක හමු වී ඇත.
- එකල මෙම ප්‍රදේශට හඳුන්වා ඇත්තේ මෙසපොතේනියාව නමිනි.( එහි තේරුම දෙගම්මැදිය යන්නයි )
- ශිෂ්ටාචරයේ තොටිල්ල , සශ්‍රීකභාවයේ චන්ද්‍රවංකය යන නම් වලින්ද මෙම ශිෂ්ටාචාරය



- ඉරිඩු , නිපුර් , උරුක් , ඌර් ආදී නගර මෙම ශිෂ්ටාචර යේ පැවති නගරයන් කිහිපයකි.
- ලෝකයේ ප්‍රථමයෙන් මුදල් භාවිතා කල ශිෂ්ටාචාරයයි.

අන්තර්ගතය - K.S.රංජනී - ගුරු උපදේශිකා - හොරණ අධ්‍යාපන කලාපය.
සැකසුම - K.A. අමරසේන - බප/කො/හින්දු විද්‍යාලය - කොළඹ 04.

## යුප්‍රටීස් - ටයිග්‍රීස් ශිෂ්ටාචරයෙන් ලොවට ලැබුනු දායද

- හමුරාබි රජු විසින් මැටි පුවරුවක සකස් කල "හමුරාබි නීති සංග්‍රහය"



- කූඤ්ඤ අක්ෂර භාවිතා කිරීම.




- ලෝකයේ ප්‍රථම පුස්ථකාලය (නිපුර් නගරයේ දේවාලයක මැටි පුවරු විශාල ප්‍රමාණයක් රැස්කර තිබූ නිසාය. )



- රෝදය නිර්මාණය කිරීම.




- ශිගුරාත් නම් ආගමික ගොඩනැගිලි.

- පැරණි ලෝකයේ පුදුම හතෙන් එකක් වූ බැබලෝනියාවේ එල්ලෙන උද්‍යානය .



The National e-learning Portal for The General Education

# නයිල් නිම්න ශිෂ්ටාචාරය.




The National e-learning Portal for The General

ඔබ දන්නවාද?

- අප්‍රිකා මහද්වීපයේ පිහිටි රටක් වන නයිල් ගංගාවේ ආසන්නයේ මෙම ශිෂ්ටාචරයේ ගොඩනැගිණි.
- මෙම ශිෂ්ටාචාරයේ රජවරු "පාරවෝ" යන නමින් හඳුන්වා තිබේ.
- පාලනයේ ඉහළට තත්ත්වය රජුට හිමි විය. ඊළඟට වැදගත් වූයේ ආගමික පූජකවරුන් ය.

# නයිල් නිම්න ශිෂ්ටාචාරයෙන් ලොවට ලැබුනු දායද

- පිරමීඩ




- මළවුන්ගේ පොත



- පැපිරස් පත්‍ර වල ලියන ලද ලේඛන




# ඉන්දු නිම්න ශිෂ්ටාචාරය




- සින්දු නදිය මුව දොර පිහිටි "ලෝතාල්" මෙම ශිෂ්ටාචාරයේ වරායන් වරායන් වියහැකි බවට විශ්වාස කරයි.
- මොහන්ජොදාරෝ හරප්පා නගර දෙකෙහි හමුවූ නටබුන් අතර මහා ධාන්‍යාගාරයක් යැයි විශ්වාස කරන ගොඩනැගිල්ලක් සහ නාන තටාකය වඩාත් ප්‍රසිද්ධය.


The Great Granary



- ගොඩනැගිලි කාණු පධතිය ප්‍රාකාර ආදිය මනා ලෙස සැලසුම් කල නගරයක ලක්ෂණ විදහාපයි.


# ඉන්දු නිම්න ශිෂ්ටාචාරයෙන් ලොවට ලැබුනු දායාද

❖ විවිධ ප්‍රතිමා.

- මව් දෙවඟන →



- පූජක රුව →



- නලඟන →



- පුරුෂයෙකුගේ හිසක් →



- ❖ සෙල්ලම් කරත්ත →



- ❖ නගර නිර්මාණ →



- ❖ විවිධ ආභරණ →



# හොවැංහෝ නිම්න ශිෂ්ටාචරය




හොවැංහෝ නදිය

ඔබ දන්නවාද?

- ❖ චීනයේ හොවැන්හෝ නදිය එරට නදී අතුරින් දෙවැනි තැන ගනී.
- ❖ නිතර ජල ගැලීම් වලින් , මහා විපත් සිදුවන නිසා මෙම ගඟ චීනයේ ශෝකය නමින් හඳුන්වයි.
- ❖ පොළවේ සාරවත් පස සෝදාගෙන ගලා බසින ජලය කහ වර්ණ නිසා කහ ගංගාව නමින්ද හඳුන්වයි.
- ❖ උතුරු මැද චීනයේ ජල උල්පත් සහ විල් වලින් ආරම්භ චීන හොවැංහෝ නදිය නැගෙනහිර දෙසට ගලා බසී.
- ❖ අවසානයේ බෝ-හයි බොක්කෙන් මහ සමුදුර සමඟ එක්වේ.
- ❖ හොවැංහෝ නදිය පහළ ප්‍රදේශයේ (වර්තමාන හෙනන් ප්‍රාන්තයේ ) මෙම ශිෂ්ටාචාරය පැවති බවට සාධක හමු වේ.


# හොවැංහෝ නිම්න ශිෂ්ටාචාරයෙන් ලොවට ලැබුනු දායද

- ලෝකඩ නිර්මාණ





- පිඟන් භාණ්ඩ



- රූපාකාර භාවිතය

මෙම ශිෂ්ටාචාර වල වැසියන්ගේ ආගමික ඇදහිලි පිළිබඳ තොරතුරු දැන ගැනීමට පහත වගුව අධ්‍යනය කරන්න.

| ශිෂ්ටාචාරය | ආගමික ඇදහිලි හා විශ්වාස |
|---|---|
| යුප්‍රටීස් - ටයිග්‍රීස් ශිෂ්ටාචරය | i. හිරු දෙවියන්(ෂමාස් ) සඳු ඩෙවියන් වන්දනය.<br>ii. මාඩුක් , ඉ ආ,සින් නැමති දෙවිවරු ඇදහීම.<br>iii. එස්තර් නමින් දේවතවියක් ඇදහීම. |
| නයිල් නිම්න ශිෂ්ටාචරය | i. ඔසිරිස් , රේ , හොරස් නම් වූ දෙවිවරු ඇදහීම. |
| ඉන්දු නිම්න ශිෂ්ටාචාරය | i. මව් දෙවඟන පිදීම.<br>ii. වෘක්ෂ වන්දනාව. |
| හොවැංහෝ නිම්න ශිෂ්ටාචරයෙන් | i. මළවුන් ඇදහීම.<br>ii. ස්වාභාවික වස්තූන් දේවතයෙන් පිදීම.(හිරු , සඳු , අව්ව , වැස්ස) |